WWW.ASKNETWORK.NET

Sinhala

යාච්ඤා කිරීම...
සෑම දේශයකින්ම, ගෝත්‍රයකින්ම, ජන සමූහයකින්ම සහ භාෂාවකින්ම වූ ජනතාව වෙනුවෙන්

ආත්මයාණන් වහන්සේ ද මනාලිය ද “එන්නැ”යි කියති. අසන්නෝ ද, “එන්නැ”යි කියත් වා! පිපාසය ඇත්තෝ ද එත් වා! කැමැති කෙනෙක් ජීවන පැන් නොමිලයේ ගනිත් වා!
— එළිදරව්ව 22:17

“ඉන්පසු සියලු ජාතීන්ගෙන්ද ගෝත්‍රවලින්ද ජනසමූහයාගෙන්ද භාෂාවන්ගෙන්ද කිසිවෙකුට ගණන් නොකළ හැකි තරම් ඉමහත් පිරිසක්, සුදු සළු පැළඳ, තালපත්‍ර අතින්ගෙන, සිංහාසනය හා බැටළු පෝතකයාණන් ඉදිරියෙහි සිටිනු මම දිටිමි.” **එළිදරව් 7:9** මේ දවස පැමිණෙන තෙක් අපි ඉතා ඔනෑකමින් බලාසිටින්නෙමු. ඒ දවසේදී අපගේ ඉල්ලීම අවසන් වන නමුත් ඒ වන තෙක්, අපගේ යාච්ඤාවන් ඒ මහා දවස පැමිණීම සඳහා සූදානම් විය යුතුයි.

“සෙනඟ, ගෝත්‍ර,භාෂාව සහ දේශය” යන වචන හතර එළිදරව් පොතේ පස් වරක් සඳහන් කර ඇති නමුත් ඒවා එකම පිළිවෙලට නොවේ; එයින් පෙන්වන්නේ ඒ හතරම දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරිපිට එකසමානව වැදගත් වන බවයි. **එළිදරව් 5:9, 7:9,11:9,13:7, 14:6**

දේශයන් උදෙසා ඉල්ලීම

බයිබලයේ දේශයන් පිළිබඳ සටහන් 600න් අපට පෙන්වන්නේ ඒවා සඳහා දෙවියන්වහන්සේගේ අභිප්‍රායෙන් යුත් සැළසුම් සහ මිදීමේ අරමුණු ය. දැනට පිළිගත් ස්වාධීන ස්වෛරී රාජ්‍යයන් 195ක් ඇත.මෙම සන්දර්භය තුළ, දේශයක් යනු භූගෝලීය දේශසීමාවන් මගින් අර්ථ දක්වා ඇති සහ පාලන ආයතනයක් යටතේ ඇති භූමියක් ලෙස විස්තර කළ හැකිය.

ඔබගේ දේශය උදෙසා ඉල්ලා සිටින්න. සියල්ලටම ප්‍රථමයෙන්, සෑම දෙනාවෙනුවෙන් අයැදුම්ද යාච්ඤාද ඉල්ලීම්ද ස්තුතිදීම්ද ඔප්පුකළයුතු බවමගේ අවවාදයයි. භක්තියෙන් හා ගෞරවයෙන් යුක්තව, සාමකාමී තැන්පත්ජීවිතයක් අපට ගතකළ හැකිවන පිණිස, රජවරුන් හා උසස් තනතුරුද රන සියල්ලන් උදෙසාද යාච්ඤා කළයුතුය. මෙය මිදුම්කාරදෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ය. ප්‍රසන්නය.

මෙය මිදුම්කාරදෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ය. ප්‍රසන්නය. සියලු මනුෂ්‍යයන්ගේ මිදීමත්, ඔවුන් සත්‍යයදැනගැනීමත් දෙවියන්වහන්සේගේ කැමැත්තය. **1 තිමෝති 2:1-4**

සෑම දේශයකම ශක්තිමත් ගෝලයින් ඇතුව සභාව ස්ථාපිත වන ලෙසට යාච්ඤා කරන්න: එබැවින් ඔබගොස්, සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න; පියාණන්ගේද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන්ගේද නාමයෙන් ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න; මා ඔබට අණකළ සියල්ල රක්ෂාකරන්න ඔවුන්ට උගන්වන්න. මමද යුගාන්තය දක්වා සදහටම ඔබ හා සමඟ සිටිමි”යිවදළ සේක. **මතෙව් 28:19-20**

සියළු දේශයන් වෙනුවෙන් යාච්ඤා කරන්නට සැළැස්මක් අනුගමනය කරන්න.
www.operationworld.org

මිනිසුන් උදෙසා ඉල්ලීම

ස්වාමින්වහන්සේ යාකොබ්ට මෙසේ කී සේක: “පොළොවේ සියළු ගෝත්‍රයෝ නුඹ සහ නුඹේ වංශය කරණකොටගෙන ආශිර්වාද ලබන්නෝය.” ඔහුගේ වංශය වූයේ යුදෙව් ජනතාවය. ජන කණ්ඩායමක එක් නාමයක් වාර්ගික කණ්ඩායම්කරණය විය හැකිය; සමහර විට මෙය මහද්වීප කණ්ඩායම්කරණය සමඟ සමපාත වේ.
දෙවියන්වහන්සේගේ මහිමයට ඔවුන්ගේ සුවිශේෂී ගුණාංග සහ සංස්කෘතීන් සම්පූර්ණයෙන්ම ප්‍රකාශ වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීම, යාච්ඤාව සඳහා මිනිසුන් හඳුනා ගැනීමට මෙය ඉතා ප්‍රයෝජනවත් ක්‍රමයක් විය හැකිය.

සියලු මිනිසුන් උන්වහන්සේට අයිති වන ලෙස දෙවියන් වහන්සේට නමස්කාර කරන්න. එම එළිදරව්ව සියලු මිනිසුන්ට පැමිණෙන ලෙස යාච්ඤා කරන්න. පොළොවහා එහි ඇති සෑම දෙයද සකලලෝවාසීහුද සමිඳුන් සන්තක වෙති. **ගීතාවලිය 24:1**

ජන කණ්ඩායම් අතර වාර්ගික බෙදීම්, විශේෂයෙන් ලොව පුරා සභාවන් තුළ, බිඳ දැමීම උදෙසා යාච්ඤා කරන්න.
සාමයඇතිකරන්නෝ භාග්‍යවන්තයෝය;
ඔවිහු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝය. **මතෙව් 5:9.**

සෑම ජන කණ්ඩායමක් වෙතටම ශුභාරංචිය බලයෙන් යුක්තව යන ලෙසට අස්වැන්නේ ස්වාමියාගෙන් ඉල්ලා සිටින්න.සියලු වි ජාතීනි, සමිඳුණන්වහන්සේට ප්‍රශංසා කරන්න; සියලු ජාතීහු උන්වහන්සේට ප්‍රශංසා කරත්වා. **රෝම 15:11**

භාෂාවන් උදෙසා ඉල්ලා සිටීම

අද දින ලෝකයේ කථා කරනු ලබන භාෂාවන් ගණන අවම වශයෙන් 6,800කි. බයිබලයේ කිසිම කොටසක් නොමැති, නමුත් බයිබල් පරිවර්තනයක් ආරම්භ වීමට අවශ්‍යතාවයක් ඇති භාෂා සංඛ්‍යාව 2,000ට වැඩිය. මෙය මිලියන 340ක ජනතාවකට බලපානු ඇත.

සෑම කෙනෙකුටම ශුභාරංචිය තමන්ගේම භාෂාවෙන් අසන්නට ලැබෙන පිණිස බයිබලය සෑම භාෂාවකටම පරිවර්තනය වන ලෙසට යාච්ඤා කරන්න. අදහා නොගත් කෙනෙකුට යැදුම් පුදන්නේ කෙසේද? නෑසූ කෙනෙකු අදහන්නේ කෙසේද? දේශකයෙකු නැති ව අසන්නේ කෙසේ? **රෝම 10:14**

wycliffe.org, pioneerbible.org, www.lbt.org හි සේවය වෙනුවෙන් සපයන ලෙසත් එය සමෘධිමත් වන ලෙසටත් යාච්ඤා කරන්න. අපගේ දෙවි සමිඳුණන්ගේ අනුග්‍රහය (ඔවුන් මත) වේවා; (ඔවුන්ගේ) දෑතේ වැඩ ස්ථාපිත කරන්න - ඔව්, (ඔවුන්ගේ) දෑතේ වැඩ ස්ථාපිත කරන්න. අප දෙවිඳුන්ගේ කරුණාව අප කෙරෙහි බැබළේවා! අපේ වැඩකටයුතු ඔබ මඟින් ජයෙන් ජයටම පැමිණේවා! **ගීතාවලිය 90:17**

බාබෙල් කොත ගොඩනැගීමෙන් පසු උන්වහන්සේගේ විනිශ්චයේ බලපෑම ආපසු හරවන ලෙසට දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න: සමිඳුණන්වහන්සේ ඒ නගරයෙහිදී මුළු ජනතාවගේ භාෂාව අවුල් වියවුල් කළ බැවින් ඊට ‘බාබෙල්’ යැයිනම යෙදිණි. එතැනින් සමිඳුණන් වහන්සේ ඔවුන් මහ පොළොව පුරා විසිර වූ සේක. **උත්පත්ති 11:9**

ගෝත්‍ර උදෙසා ඉල්ලා සිටීම

ඉශ්‍රායෙල් එක් දේශය තුළ ගෝත්‍ර දෙළසක් තිබිණ. ලෝකයේ බොහෝ දේශයන්හි අභ්‍යන්තර ගෝත්‍රික පද්ධති තිබේ. ගෝත්‍ර බොහෝ විට ආරම්භ වූයේ පවුල් වශයෙන් හෝ වෙනත් යම් සමීප කණ්ඩායම් ලෙසය. ඔවුන් බොහෝ විට හඳුනාගත හැක්කේ භාෂාව, ජීවන රටාව හෝ භූගෝලීය වශයෙනි. දේශයන් තුළ ශුභාරංචිය ළඟා නොවූ ජන කණ්ඩායම් ලෙස ගෝත්‍ර පැවතීම ඉතා සුලභ දෙයකි. ශුභාරංචිය ළඟා නොවූ ජන කණ්ඩායම් වෙනුවෙන් යාච්ඤා කරන්න සම්බන්ධ වෙන්න. ආසන්න වශයෙන් ශුභාරංචිය ළඟා නොවූ ජන කණ්ඩායම් 7,000ක් ඇත. එනම් සියළුම ජන කණ්ඩායම් වලින් 41%ක් ශුභාරංචිය අසා නැත. එනම් බිලියන 2.84ක ජනතාවකි. ඔබට www.joshuaproject.net ට ඇතුල් වී සෑම දිනකම වෙනත් ශුභාරංචිය ළඟා නොවූ ජන කණ්ඩායමක් වෙනුවෙන් යාච්ඤා කරන්නට තොරතුරු ලබාගත හැකිය. තාක්ෂණයේ සහ සයිබර් අවකාශය නම් වරප්‍රසාදය තුළින් ශුභාරංචිය දිනෙන් දින වැඩි වන වේගයකින් සහ ඵලදායීතාවයකින් පෘථිවියේ කෙළවර දක්වා පැතිර යනු ඇතැයි යාච්ඤා කරන්න. දුගී දුප්පත් අය කාබී තෘප්තිමත් වන්නෝය; හිමි තුමන් සොයන්නෝ එතුමන්ට ගී පසස් නඟන්නෝය. ඔවිහු සදහටම සෞභාග්‍යයලබත්වා! මහපොළොවේ සතරදිගින් ජනයෝ සමිඳුන් සමරමින් එතුමන් වෙත හැරී එති. සකල ලෝක වාසීහු ඔබ අබිමුව වැඳ වැටෙති. **ගීතාවලිය 22:26-27**

ජාතීන් අතරෙහි එතුමන්ගේ මහිමය ද සියලු ජාතීන් අතරෙහි එතුමන්ගේ ක්‍රියා ද පතළ කරන්න.
1 වංශාවලිය 16:24

ASK Network හට සෑම දේශයකින්, සෑම ගෝත්‍රයකින්, ජන කණ්ඩායමකින් සහ භාෂාවකින් සෑම දෙනෙක්ම අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගැළවීම වෙත පැමිණෙන පිණිස යාච්ඤා කරමින් එහි ඉරණම ඉටු කළ හැකිය. ආමේන්